# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2446/36 - 2025 ජූලි මස 22 වැනි අඟහරුවාදා - 2025.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතන පනත යටතේ පිහිටුවන ලද කඳවල වත්ත, අංක 2, සේනාධිපති ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, රත්මලාන යන ලිපිනයෙහි පිහිටා ඇති "ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය" සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති කෙටි යෙදුමට අනුරූපීව මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ දක්වා ඇති උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් "ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය"මෙම නියමය මගින් පිළිගනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 90 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 5 වන ස්ථරයේ) රෙදිපිළි හා ඇඟලුම් අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සම්බන්ධයෙන්,

    (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂයය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (03) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම; සහ

    (ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී අවම වශයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

    යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

1A - PG 7212 — 284 (2025/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව කඳවල වත්ත, අංක 2, සේනාධිපති ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, රත්මලාන, ශ්‍රී ලංකාව යන ස්ථානයේ පමණක් පැවැත්විය යුතුය.

3. ආයතනය විසින්, මෙම නියමය ප්‍රකාශයට පත්කල දිනයේ සිට සෑම වසර පහකට (5) වරක් නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමිය යුතුය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| රෙදිපිළි හා ඇඟලුම් අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී | බීඑස්සී (රෙදිපිළි හා ඇඟලුම් අධ්‍යයනය) |

ආචාර්ය **හරිනි අමරසූරිය**,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 ජූලි මස 18 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 - 0282

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.